රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 284

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1985 අප්‍රේල් මස 7 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

රජයේ නිලධරයන්ට සම්පූර්ණ වැටුප් සහිත විදේශ අධ්‍යයන නිවාඩු සහ විදේශයන්හි අධ්‍යයන කටයුතු/රැකියාවන් පිණිස වැටුප් රහිත නිවාඩු සඳහා වන අනිවාර්ය සේවා කාලය සංශෝධනය කිරීම.

1. සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු සඳහා අනිවාර්ය සේවා කාලය.

අංක: 170 සහ 1974.12.18 දින දරණ ආයතන චක්‍රලේඛය යටතේ සම්පූර්ණ වැටුප් සහිත විදේශ අධ්‍යයන නිවාඩු සඳහා වන අනිවාර්ය සේවා කාලය මෙයින් සංශෝධනය කෙරේ. රජයේ වියදමින් රාජකාරි මත, සම්මන්ත්‍රණයක් හෝ වැඩ මුලුවක් හෝ විදේශීය ශිෂ්‍යත්වයක් සඳහා විදේශ ගතවන රජයේ නිලධරයකු ආපසු මෙරටට පැමිණ අනිවාර්ය සේවයක යෙදෙන බවට පහත සඳහන් පරිදි ගිවිසුමකට එළඹිය යුතුය.

(1) දැනට බලපවත්වන පරිදි මසක් හෝ ඊට අඩු කාලයක් සඳහා අනිවාර්ය සේවා කාලයක් නොමැත.

(11) මසකට වැඩි කාලයක් සම්බන්ධයෙන් අනිවාර්ය සේවා කාලය, එක් වර්ෂයක අවමයකට හා වර්ෂ දහයක උපරිමයකට යටත්ව, නිවාඩු කාලය මෙන් තිව් ගුණයක් විය යුතුය.

(111) අනිවාර්ය සේවා කාලය ගණන් බැලිය යුත්තේ ආසන්නතම සම්පූර්ණ මාසයට විය යුතු අතර, නිවාඩු කාලය ගණන් බැලිය යුත්තේ අවම ගමන් කාලයද ඇතුලත්වය.

2. 1980.03.24 දිනැති අංක.344 දරණ ආයතන චක්‍රලේඛය යටතේ, විදේශයන්හි අධ්‍යයන කටයුතු/රැකියා පිණිස වැටුප් රහිත නිවාඩු සඳහා අනිවාර්ය සේවා කාලය.

නිලධාරියාගේ වැටුප් රහිත නිවාඩු ආරම්භ කරන අවස්ථාව වන විට නිමකොට ඇති ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත සේවයෙහි සෑම සම්පූර්ණ වර්ෂයක් සඳහාම එක් මසක් බැගින් පහත සඳහන් කොන්දේසි වලට යටත්ව අනිවාර්ය සේවා කාලයෙන් අඩුකළ යුතුය.

(1) මෙම අඩුකිරීම් කළ යුත්තේ වැටුප් රහිත නිවාඩු ලබා නොමැති වර්ෂයන් සඳහා පමණක් විය යුතුය.

(11) අවම අනිවාර්ය සේවා කාලය වර්ෂයක් විය යුතුය.

3. ඉහත දක්වා ඇති අනිවාර්ය සේවා කාලයන්, නිලධාරීන් දැනටමත් එළඹ ඇති බැඳුම්කර/ගිවිසුම් වලට ද අදාළ වනු ඇත.

ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.